සියලු හිමිකම් ඇවිරිණි/ All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

**21 | S | I**

පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2018
First Term Test - Grade 10 - 2018

**විභාග අංකය ...................................    සිංහල භාෂාව හා සාහිත්‍යය - I    කාලය පැය 01 යි.**

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 40 තෙක් ප්‍රශ්න සඳහා දී ඇති 1, 2, 3, 4 වරණවලින් නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ පිළිතුර තෝරා පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

- අංක 01 සිට 04 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.

(1) විදේශිකයන්ගේ තාඩන පීඩන මැද නිදහසේ **මර ඇඳේ** සිටි සිංහලයන් අවදි කිරීමට එස්. මහින්ද හිමියෝ ජාතිය පණ ගන්වන කාව්‍ය රචනා කළහ.
1. නිහඬ අවස්ථාවේ  2. ආරම්භක අවස්ථාවේ
3. ගෞරවය කෙළෙසුණ අවස්ථාවේ  4. අන්තිම අවස්ථාවේ

(2) ලසිත්ගේ ක්‍රියාකලාපය පිළිබඳ ව තමා **ඇඟගහගෙන** සිටි බව පන්ති භාර ගුරුතුමා ප්‍රකාශ කළේය.
1. සැකයෙන්  2. උද්යෝගයෙන්  3. සෝදිසියෙන්  4. සතුටින්

(3) කණ්ඩායම් සාමාජිකයන් **උඩින් පල්ලෙන්** වැඩ කිරීම නිසා අපේක්ෂිත ඉලක්කය කරා ළඟා විය නොහැකි විය.
1. නොසැලකිලෙන්  2. අනවශ්‍ය ලෙස  3. අසමගියෙන්  4. භේදභින්න ව

(4) නංගීගේ නර්තන ප්‍රසංගයට සහභාගිවීමට මහනුවර මාමා **කුකුළා අතින්ගෙන** පැමිණියේය.
1. අවශ්‍ය භාණ්ඩ රැගෙන  2. පාන්දරින් ම  3. හදිසියේ ම  4. තෑගි රැගෙන

- අංක 05 සිට 08 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩා සුදුසු පදය තෝරන්න.

(5) භාෂාව මාධ්‍ය කොට ගනිමින් ............... වන ලිඛිත මෙන්ම අලිඛිත ද සියලු දෑ සාහිත්‍ය යනුවෙන් හැඳින්විය හැකි ය.
1. ආවරණය  2. අනුකරණය  3. සම්පාදනය  4. සංරක්ෂණය

(6) රටක් සංවර්ධනය කිරීමේ දී එම රටේ ස්වාභාවික සම්පත් වලින් ............... ප්‍රයෝජන ලබාගත යුතුය.
1. අවම  2. වැඩිම  3. අඩුම  4. උපරිම

(7) ගමේ දූ දරුවන්ගේ දක්ෂතා දියුණු කිරීමේ ......... ඇති ව ගම් වැසියන් එකතුවී ‘සුහද’ ක්‍රීඩා සමාජය පිහිටුවන ලදී.
1. අදහස  2. අවශ්‍යතාවය  3. පරමාර්ථය  4. උත්සාහය

(8) සිංහල, පාලි හා සංස්කෘත භාෂාත්, බුදු දහමත් හැදෑරීම සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මහතාගේ ජාති මමත්වය හා දේශ ........... පිළිබිඹු කරන අවස්ථා වේ.
1. ප්‍රේමීත්වය  2. ගවේෂණය  3. ද්‍රෝහීබව  4. නායකත්වය

(9) අකාරාදී පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පේළිය තෝරන්න.
1. අංජන, නිමේෂ්, ගයාන්, රවිඳු  2. අවිශ්ක, ඉෂාර, චමෝද්, විදත්
3. අර්ජුණ, ශසික, ඉරුෂ, ප්‍රබෝධ  4. අස්වින්, ළහිරු, දමිඳු, සුපුන්

(10) සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
1. ක්ෂේත්‍රය, ශ්‍රාවකයා, ශාස්ත්‍රීය, දේශනය  2. ස්මරනය, විමර්ශනය, කථණය, භාෂණය
3. හෙළදිව, සුළභ, ළඹය, පළය  4. ස්ථූප, පුස්ථකාලය, පරිවර්තනය, කෙටිකතාව

(11) ගයනුකිත්ත, අනුස්වාරය, යංශය හා රකාරාංශය පිළිවෙලින් යෙදී ඇති පද පේළිය තෝරන්න.
1. වාක්‍යය, රංගනය, නෞකාව, ප්‍රගමනය  2. කෞෂල්‍යය, ශ්‍රේණිය, සංසිද්ධිය, ව්‍යාකරණ
3. වංශය, ගෞරවය, විද්‍යාව, භ්‍රමණය  4. ලෞකික, ගංගාව, කෘත්‍යය, මන්ත්‍රණය

(12) ඉරි ඇඳි පදයේ ක්‍රියා වර්ගය තෝරන්න.
"වෙරළෙන් කිරි කවඩි <u>සොයා</u> - කෙනෙක් පුතුට ගෙන එනවා"
1. මිශ්‍ර ක්‍රියා 2. ප්‍රයෝජ්‍ය ක්‍රියා 3. පූර්ව ක්‍රියා 4. විධි ක්‍රියා

(13) නැන්දාට 'අම්මණ්ඩි' යනුවෙන් ආමන්ත්‍රණය කරන්නේ කුමන පළාතේ වැසියන් ද?
1. දකුණු 2. උඩරට 3. සබරගමු 4. ඌව

(14) මොනරාගල ප්‍රදේශයේ වැසියන් 'කොකිස්' යනුවෙන් හඳුන්වන්නේ
1. ඉරිඟු ය 2. පැපොල් ය 3. වට්ටක්කා ය 4. කිරි අලය

● අංක 15 සිට 17 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.

(15) මාසික ඇගයීම සඳහා ශිෂ්‍යයෝ **අලුතින් නිර්මාණය කරන ලද කතා** ඉදිරිපත් කිරීමට නොඉවසිල්ලෙන් බලා සිටියහ.
1. නවකතා 2. ප්‍රබන්ධ කතා 3. කෙටි කතා 4. සංක්ෂිප්ත කතා

(16) සාහිත්‍ය නිර්මාණයක සාර්ථකත්වය සඳහා **කතාව ඉදිරිපත් කිරීමට අනුගමනය කරන ලද ශෛලිය** ද වැදගත් වේ.
1. කථා වින්‍යාසය 2. ප්‍රතිනිර්මාණය 3. සතතාභ්‍යාසය 4. ප්‍රතිභාව

(17) මහගම සේකර මහතාගේ කාව්‍ය නිර්මාණ සැළකීමේ දී භාෂාවේ විවිධ ස්වරූප සුසංයෝජනය කරමින් **කවි කියමන්** නිර්මාණය කර ගැනීමට දරා ඇති උත්සාහය ප්‍රකට වේ.
1. කාව්‍යෝක්ති 2. වාච්‍යාර්ථ 3. හසළත්වය 4. ධ්වනිතාර්ථ

(18) වර්ගාන්ත අක්ෂර ලෙස හඳුන්වනු ලබන අක්ෂර මොනවා ද?
1. ක, ච, ට, ත, ප. 2. ය, ර, ල, ව 3. ඞ, ඤ, ණ, න, ම 4. ශ, ෂ, ස, හ, ෆ

(19) යටිතොල හා උඩුතොල ආධාරයෙන් උපදින ශබ්ද හඳුන්වන නාමය කුමක් ද?
1. දන්තජ අක්ෂර 2. ඕෂ්ඨජ අක්ෂර 3. කණ්ඨජ අක්ෂර 4. මූර්ධජ අක්ෂර

(20) එක් එක් පද පේළිවල දී ඇති පද යුගලවල **විරුද්ධාර්ථවත් පද යුගලක් ඇතුළත් පද පේළිය** තෝරන්න.
1. පිෂ්ට-පිටි, අඹ-ජලය, නද-නාදය, සතර-ශිල්පය 2. සමය-ආගම, සත්-යහපත්, වත-කතාව, සඳ-චන්ද්‍ර
3. දීර්ඝ-හ්‍රස්ව, අභිමාන-පාළු, ඇකය-උකුළ, උදක-ජලය 4. කුකුස-සැකය, දුගඳ-කුයිල, සටය-කළය, මීන-මාළු

(21) එක් එක් පද පේළිවල දී ඇති පද යුගලවල සමානාර්ථවත් පද යුගලක් **ඇතුළත් නොවන පද පේළිය** තෝරන්න.
1. හුය-නූල, සේල-සළු, මිණි-මැණික්, ළඳ-ලිය
2. ලෝචන-නයන, කග-කඩුව, අධම-නීච, ඇදුරු-ගුරු
3. රුධිරය-රුහිර, සිඳු-රුවනාර, සමය-ආගම, සතුට-ආහ්ලාදය
4. ජාතිය-රැස, මේධිනී-වසුන්දරා, ජංගම-ස්ථාවර, දිය-භුවන

(22) සාමානාර්ථ යුගල පදයක්, විරුද්ධාර්ථ යුගල පදයක්, එක් පදයක අර්ථය ඇතත් අනෙක් පදයේ අර්ථය නැති යුගල පදයක්, පූර්ව ක්‍රියා දෙකක් එක්වී සැසඳෙන යුගල පදයක් පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.
1. නීතිරීති, අයවැය, ගයාවයා, ඉඩම්කඩම්
2. සිප්සතර, ගොඩමඩ,කෝටුබෝටු, හදාවඩා
3. විහිළුතහළු, හරිබරි, තක්කුමුක්කු, කොට්ටමෙට්ට
4. කියුම්කෙරුම්, ඇඳුම්පැළඳුම්, ඇලීගැලී, ආතක්පාතක්

● අංක 23 සිට 25 තෙක් ප්‍රස්තා පිරුළු සඳහා වඩාත් ගැළපෙන අදහස ඇති වරණය තෝරන්න,

(23) උපන්ගෙයි සිරිත බලි ඇරියත් යන්නේ නැතිලු.
1. තමා උපතින් රැගෙන ආ යහගුණ ඉවතලිය නොහැකිය.
2. බොරුවට මිතුරුකම් පෙන්වමින් රහසින් හතුරුකම් කිරීම.
3. විශාල බලාපොරොත්තුවක් ඇතිව සිටිය ද ප්‍රතිඵලය අල්ප වීම.
4. උපතින් ගෙනා දුර්ගුණ නවතාලිය නොහැකි වීම.

(24) වැද්දට නිල පේනව වගේ,
1. නරක මිනිහාට වැරදි කරන්නට සියුම් අරමුණු පෙනීම.
2. සුළු දෙයින් පවා කෝප වීම.
3. අවාසනාවන්තයා කරන යහපත් කාර්යයකට වුවද බාධා පැමිණීම.
4. අසත් පුරුෂයා ගිය තැන විනාශය සැලසේ.

(25) මෝල්ගස් ගිල්ලා වගේ
1. කිසිම ප්‍රතිචාරයක් නොදක්වා නිශ්චල ව සිටීම. 2. නොනවත්වා එක දිගට කතා කිරීම.
3. නිෂ්ඵල ක්‍රියාවක් අනවබෝධයෙන් කිරීම. 4. නරක පුරුදු වයසට ගියත් කිරීම.

(26) මහාචාර්ය වල්පොළ රාහුල හිමියන් විසින් රචනා කරන ලද ග්‍රන්ථය කුමක්ද?
1. සිංහල ජන වහර 2. ලක්දිව බුදු සමයේ ඉතිහාසය
3. හෙළදිව අතීත ප්‍රතිරාව 4. සදා මෙලෙස පුර දෙරණේ

(27) 'පුප්ඵාධාන' යන වචනයේ සිංහල තේරුම කුමක්ද?
1. අඩි සලකුණු 2. වේදිකා භූමි 3. වැලි මළුව 4. සෑ ගෙය

(28) නාම පදවල නාම ප්‍රකෘතිය හා ප්‍රත්‍යය නිවැරදි ව දක්වා ඇති වරණය තෝරන්න.
1. මිනිසාට - මිනිසා + ආට 2. වසන්තය - වසන්ත + අ
3. පලසක් - පලස + ක් 4. සාගරයෙන් - සාගරය + එන්

● නිවැරදි ඡත්‍ර පදය තෝරන්න.

(29) දැඩි හිරු රැස් පවතින දිනවල ඈතින් ජලය මෙන් පෙනෙන තරංගාවලිය
1. ක්ෂිතිජය 2. මීදුම 3. අරුණාලෝකය 4. මිරිඟුව

(30) අනුක්ත පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
1. කුරුල්ලන්, ළමයි, ඇතැම්හු, ඔවුන් 2. මිනිසෙකු, සිංහයෙක්, රචනාවක්, ගැහැනියක
3. කිසිවෙකු, නිළියක, මිතුරන්, බැළලියක 4. පැළය, කම්කරුවෝ, සොරුන්, උපාසිකාවක

(31) 'ඉඳිවැට ළඟ බලා හිඳී අප එනතුරු අම්මා'
මෙහි යෙදී ඇති නිපාත පදය කුමක්ද?
1. හිඳී 2. අම්මා 3. අප 4. තුරු

(32) විරාම ලක්ෂණ නිවැරදි ව යොදා ඇති වරණය තෝරන්න.
1. ''පුතත් එනවද? හා එන්ඩ එහෙනං !''
2. ඇයි? නවතින්නේ ! අපි හොරෙන් ම යමු.
3. ''ආ. සායම් බින්දුවක් නේද!''
4. ''නැහැ, නැහැ'' යි කී කම්මල්කරු මෙසේ පැවසීය.

(33) නිවැරදි අදහස දෙන වරණය තෝරන්න.
1. සිංහල භාෂාවේ නාම ප්‍රකෘතිය විශේෂණය වශයෙන් භාවිත නොවේ.
2. අප්‍රාණවාචී නාමපදවල ඒක වචන රූපය නාම ප්‍රකෘතිය වේ.
3. මිශ්‍ර ක්‍රියාවල යෙදෙන පද දෙකෙන් පළමු වැන්න ධාතු ප්‍රකෘතිය වේ.
4. ප්‍රයෝජ්‍ය ක්‍රියා ප්‍රත්‍යය වන 'ව' යන්නට පෙර නාම ප්‍රකෘතිය දැකගත හැකි ය.

(34) ''පැණි කොමඩු වැල - යන එන සෑම තැනක ම තියා යනවාමයි ගෙඩියක් - හේන මත තහවුරු කරන්නට තම අයිතිය.'' උපුටාගත් කාව්‍ය ඛණ්ඩයේ රචකයා වන්නේ,
1. රුවන් බන්දුජීව ය. 2. සිරි ගුණසිංහ ය.
3. නන්දන වීරසිංහ ය. 4. බර්ට් බී. කුඩාහෙට්ටි ය.

● අංක 35 සිට 38 තෙක් ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූලව වඩාත් නිවැරදි වාක්‍ය තෝරන්න.

(35) 1. ඔවුහු පරණ තරහමරහ අකාමකා දැමීමට තීරණය කළේය.
2. සියලු ම ගංගාවෝ සයුරට ගලා බසී.
3. කාන්තා දිනයේ දී කාන්තාවෝ පෙරට එති.
4. විශිෂ්ට සාමාර්ථ්‍යයන් ලබාගත් සිසුහු මෙවර වැඩි වී ඇත.

(36) 1. ලාලිත්‍යාගේ ප්‍රියතම ආහාරය කිරිබත් බව මව පැවසුවේය.
2. පොල් ගසට නැග ගත් මිනිසා කුරුම්බා ගෙඩි කැඩූහ.
3. ඇතැමෙක් ජයග්‍රහණයෙන් උදම් ව ප්‍රීති ඝෝෂා නගති.
4. දේශනය අසා සිටි සැමගේ සිත් පහන් වූහ.

(37) 1. සයුරු රළ පෙළ ගොඩබිම පරයමින් ඇදී ආවේය.
2. යාචකයන් පදික වේදිකාවේ ඇවිදිමින් හිඟමන් යදියි.
3. සොයාගත් පුරාණ කාසි මගින් වැදගත් අතීත තොරතුරු අනාවරණය වූහ.
4. අසරණ මගියා දුටු විදේශිකයා ඔහුට සහාය වූවෝය.

(38) 1. මිතුරෝ අතර සුහද බව වර්ධනය කිරීමට කටයුතු කළ යුතු ය.
2. මහගමසේකරයෝ 'රත්නදීප ජන්මභූමි' ගීතය රචනා කළහ.
3. කුරුලු රංචුව කැදලි කරා පියාසර කරන ලදී.
4. අපි අත්පොළසන් දෙද්දී සචිනි තරගය නිම කළාය.

- අංක 39 සහ 40 ප්‍රශ්නවල මුලින් දී ඇති කොටසේ අර්ථයට වඩාත් ගැළපෙන කොටස දී ඇති පිළිතුරු අතරින් තෝරන්න.

(39) "නඳනා දන නෙත් පැහැ ලණු ලා සිට"
1. සතුටට පත් ජනයා නේත්‍ර නැමති යොත් දමා...
2. ලණු නැමති නෙත් යෙදූ සතුටට පත් ජනයා...
3. සතුටට පත් ජනයා විවිධ පැහැ ලණු දෙස බලා...
4. පැහැපත් නෙත් වැනි යොත් බලා සතුටු වන මිනිසුන්...

(40) 'සොබමන් සුනිල් මිණි නිල් නුබ තුර විපුල'
1. තද නිල්පාට මැණික් මෙන් ශෝබමාන වූ අහස නැමති වෘක්ෂයෝ
2. ශෝබමාන, විශාල තද නිල් පාට මැණික් මෙන් වූ අහස නැමති වෘක්ෂයෙහි
3. ශෝබමාන වූ තද නිල් පාට මැණික් මෙන් නිල්පාට වූ විශාල අහස නැමති වෘක්ෂයෙහි
4. විශාල නිල්පාට මැණික් මෙන් ශෝබමාන නැමති අහසෙහි.

***